# ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
## ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
## පුරප්පාඩු

**1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර, සෑම සුක්කානමක් පසුපසම නීරෝගී රියදුරෙකු බිහි කිරීම අපගේ දැක්ම වේ.**
**ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන්, අප ආයතනය ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමට වෘත්තිකයන්ගේ දායකත්වය අවශ්‍ය බැවින් පහත පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## රියදුරු, වෛද්‍ය ඕඩර්ලි හා රසායනාගාර සහයක

### 1. රියදුරු - PL 3 – පුරප්පාඩු සංඛ්‍යාව – 01

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක්(02) සහිතව විෂයයන් හය(06) කින් සමත්වීම.

ප්‍රවීණතා

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බරවාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක(03) පළපුරුද්දක් ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බරවාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබාතිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක(03) පළපුරුද්දක් ලබාතිබීම

සහ

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ(05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස :-** අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :-**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 II උපලේඛනයේ පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | PL 3<br>රු. 26,290-10×270-10×300- 10×330- 12×350-39,490 |

### 2. වෛද්‍ය ඕඩර්ලි - PL 2 – පුරප්පාඩු සංඛ්‍යාව – 07

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන්**

1. තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

   හෝ

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සුදුසුකම් අතුරින් අංක I හෝ II හෝ III)**

I. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.
II. එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
III. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම.

- **වයස :-** අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :-**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 II උපලේඛනයේ පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | PL 2<br>රු. 25,750-10×270-10×300- 10×330- 12×350-38,950 |

### 3. රසායනාගාර සහයක – PL 1 – පුරප්පාඩු සංඛ්‍යාව – 02

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම හා විෂයන් 02 ක් වත් අවම වශයෙන් සමත්ව තිබීම.

- **වයස :-** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

- **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :-**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>කළමණාකරණ සේවා චක්‍රලේඛ 02/2016 II උපලේඛනයේ පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | PL 1<br>රු. 24,750-10×250-10×270- 7×300- 15×330-37,000 |

**ඉහත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම්:-**

සෑම අයදුම්කරුවෙකුම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සතු වේ.

**සියළුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් සකස් කර අදාළ සහතිකවල සහතික කළ පිටපත්ද සමඟ ඥාති නොවන දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකථන අංකය සහිතව පහත ලිපිනයට 2025.02.03 දින හෝ ඊට ප්‍රථම අයදුම් කරන තනතුර ද ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.**

**සභාපති,**
**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,**
**අංක 170, හයිලෙවල් පාර,**
**නුගේගොඩ.**
**දුරකථන :- 011 2852868**